**<u>Trial Monitoring report</u>**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද) :** පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට තොරතුරු ලැබී තිබියදීත් එය පොලිසියට වසන් කළේ යැයි චෝදනා කරමින් මොහොමඩ් ඊබ්‍රහිම් ඇතුළු විත්තිකරුවන් 3 දෙනෙකුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරා ඇති නඩුවකි.

**Case no (නඩු අංකය) :** HC 3072/21

**Courts (අධිකරණය) :** – කොළඹ මහාධිකරණ අංක 5

**Date of hearing (නඩුව අසන ලද දිනය ) :** 2024 ජූලි මස 18 වන දින

**Author (s) of report (වාර්තාවේ කතෘ හෝ හෝ කතෘන් ) :** හිරුණි පෙරේරා සහ නුරේකා රුද්‍රිගු

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නවරත්න මාරසිංහ මහතා | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාර්තුමේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණි ගිරිහාගම | |
| **Police (CID / TID etc.)**<br>**(පොලිසිය-අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව/ත්‍රස්ත විමර්ශන ඒකකය/වෙනත්)** | | |
| **Accused/Suspects**<br>**(චූදිත/සැකකරුවන්)** | 01) මොහොමඩ් යුසුෆ් ඊබ්‍රහිම්<br>02) මොහොමඩ් ඊබ්‍රහිම් හිජාස් අහමඩ්<br>03) මොහොමඩ් ඊබ්‍රහිම් ඉස්මයිල් අහමඩ් | |
| **Lawyers for accused / suspects (චූදිත පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් )** | 1 චූදිත වෙනුවෙන් ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න<br>2 චූදිත වෙනුවෙන් නීතිඥ චමින්ද අතුකෝරළ<br>3 චූදිත වෙනුවෙන් ජනාධිපති නීතිඥ නලින්ද ඉන්දතිස්ස | |
| **Aggrieved party** (අගතියට පත් පාර්ශවය) | | |

| | | |
|---|---|---|
| **Lawyers for aggrieved party (අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් )** | | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ/ සැකකරුවන්ගේ ආධාරකරුවන් )** | | |
| **Supporters of aggrieved party (අගතියට පත් පාර්ශවයේ ආධාරකරුවන්)** | | |
| **Others (වෙනත් අය)** | | |

**2. What happened in the court hearing?** (උසාවි විභාගයේදී සිදු වූ දේ)

1 සිට 3 දක්වා චූදිතයන් පෙනී සිටින ලදි.

පැ.සා 29 ගෙන් වැඩිදුර මූලික ප්‍රශ්න විමසීම දෙවන දිනටත් පැවැත්වුණි.

2024.07.16 සාක්ෂි සටහන්වල නිවැරදි කිරීමේ අයිතිය රඳවාගෙන ඉදිරි සාක්ෂි විමසීම ආරම්භ කරන ලදී.

පැ 1 (G) ලෙස සලකුණු කරන ලද කවරයෙහි තුළ ඇති පැ 1 (I) ලෙස සලකුණු කරන ලද CD තැටිය ධාවනය කරමින් පැ.සා 29 ගෙන් මූලික ප්‍රශ්න විමසන ලදී.

එදින මහවිල උද්‍යානයේ පිහිටි නිවසේ සිදුවූ පළමු පිපිරීමෙන් පසු එම ස්ථානයට දෙමටගොඩ පොලිසියේ නිලධාරීන්, පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් හා කොළඹ අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් පැමිණි බවද සාමාන්‍ය පුද්ගලයන්ට එම ස්ථානයට ප්‍රවේශ වීමට අවසර නොතිබුණු බවද පැ.සා 29 සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කරන ලදී.

නිවස තුළ සිදුවූ පළමු පිපිරීම පළමු මහලේ වම් පස ඉදිරියෙන් පිහිටි කාමරය තුළදී සිදුවූ බවට පැ.සා 29 ප්‍රකාශ කරන ලදී.

තවදුරටත් සාක්ෂි දෙමින් පැ.සා 29 ප්‍රකාශ කර සිටියේ තමා මහවිල උද්‍යානයේ පිහිටි නිවස තුළ සිදුවූ පළමු බෝම්බ පිපිරීමෙන් පසු පළමු මහලේ ඇති වූ ගින්න නිරීක්ෂණය කිරීමෙන් පසු නිවසේ ප්‍රධාන විදුලි සැපයුම අත්හිටුවීමට තීරණය කරන ලද බවත් ඒ සඳහා පළමුවන චූදිත නිවස තුළට කැඳවාගෙන ගිය බවත්ය.

CCTV දර්ශන මගින් දැකගත හැකි වූ නිවස නැවත කම්පනය වීම පැ.සා 29 විසින් එය නිවස තුළ ඇති වූ දෙවැනි බෝම්බ පිපිරීම නිසා ඇති වූ තත්ත්වයක් බවට සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේ ය.

නිවස තුළ සිදුවූ දෙවන බෝම්බ පිපිරීමෙන් පසු එම අවස්ථාවේ නිවස තුළ රැඳී සිටි නිලධාරීන් වහාම නිවසින් පිටතට පැමිණි බවත් ඒ සමග 1 වන චූදිතද නිවසින් පිටතට පැමිණි බවත් පැ.සා 29 ප්‍රකාශ කර සිටියේ ය.

පැ.සා 29 විසින් CCTV දර්ශන මගින් දැකගත හැකි වූ නිවසේ පළමු මහලින් පිටවන දූමාරය නිවස තුළ සිදුවූ දෙවන පිපිරීම නිසා ඇතිවූ බවට සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටින ලදී.

නිවස තුල සිදුවූ දෙවන පිපිරීමෙන් පසු විශේෂ කාරය බලකා නිලධාරීන් විසින් නිවසේ 'වට ආරක්ෂාව' යෙදීමට කටයුතු කරන ලද බවත් 'වට ආරක්ෂාව' යනු නිවසට, පිටතින් සිදුවිය හැකි ප්‍රහාරයක් වළක්වීම සඳහා යොදන ලද ආරක්‍ෂාවක් බවත් පැ.සා 29 ප්‍රකාශ කර සිටින ලදී.

ඉන්පසු නිවස තුළ පැවැති ගින්න මැඩ පැවැත්වීම සඳහා ගිනි නිවන හමුදා නිලධාරීන් එතැනට පැමිණි බවත් පැ.සා 29 ප්‍රකාශ කර සිටින ලදී.

තවදුරටත් සාක්ෂි දෙමින් පැ.සා 29 ප්‍රකාශ කර සිටියේ මේ අවස්ථාවේදී තමාගේ ජීවිතයට ද තර්ජනයක් පැවති බැවින් ව්‍යාකූල මානසිකත්වයකින් සිටි බවයි.

නඩු කටයුතු ප.ව 12.30 ට තාවකාලික නැවැත්වූ අතර ප.ව 1.45 ට නැවත ආරම්භ කරන ලදි.

CCTV දර්ශන මගින් පැ.සා 29 පළමු බෝම්බ ප්‍රහාරයෙන් පසුව T56 ගිනි අවියක් රැගෙන දෙවන වරට නිවස තුළට ගිය දර්ශනත් නිවස පරීක්ෂා කර නැවත වරක් 1 චූදිත සමග නිවසේ විදුලි සැපයුම විසන්ධි කිරීම සඳහා නිවස තුළට සිව්වන වරටත් ඇතුළු වූ දර්ශනත් විකාශය කළ අතර පැ.සා එම දර්ශන විස්තර කරමින් සාක්ෂි ලබා දෙන ලදි.

තවදුරටත් STF නිලධාරින් ඉනිමගක් ආධාරයෙන් නිවසේ ඉහළ මහලට ඇතුළු වන ආකාරයත් නිවසේ ආරක්ෂාව තහවුරු කිරීමෙන් පසුව ගිනි නිවන නිලධාරින් නිවසේ ඇති වූ තිබූ ගින්න නිවා දමන දර්ශනත් CCTV මගින් විකාශනය කළ අතර පැ.සා එම සිදුවීම විස්තර කරන ලදි.

පැ.සා විසින් ප.ව 2.15 – 2.25 අතර කාලය වන විට එදින දිවයිනේ සිදු වූ බෝම්බ ප්‍රහාර මාලාවෙන් විශාල පිරිසක් මියගොස් ඇති බවට දැනගත් බව සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කරන ලදි.

මූලික ප්‍රශ්න අවසන් වූ පසු 1 චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න විමසන ලදි.

එහිදී පැ.සා විසින් ෂැන්ග්‍රිල්ලා හෝටලයේ බෝම්බ පිපිරීමට අදාළ සැකකරුවන් සම්බන්ධයෙන් තොරතුරු සොයාගන්නා ලද්දේ කෙසේද යන්න සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසීය. ඊට පිළිතුරු වශයෙන් ෂැන්ග්‍රිල්ලා හෝටලයේ තාක්ෂණික කාමරයේ CCTV දර්ශනවලින් සැකකරුවන් හඳුනාගත් බවත් එහිදී ඔවුන් දෙදෙනාම 116 කාමරයේ රැඳි සිටි බවත් එම තොරතුරු පරිගණක දත්තවලින් තහවුරු කරගත් බවත් පැ.සා විසින් සාක්ෂි ලබා දුන්නේය. නමුත් අදාළ කාමරය වෙන් කරවාගැනීම සිදු කළේ කවුරුන්ද යන්න පිළිබඳ සාක්ෂිකරු නොදන්නා බව සඳහන් කළේය.

තවදුරටත් පැ.සා විසින් මහවිල උද්‍යානයට යන අවස්ථාවේදී ඒ වන විටත් එම ස්ථානයට පැමිණ සිටි කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරින් පැමිණියේ කාගේ උපදෙස් මත ද යන්න හරස් ප්‍රශ්න නැගූ අතර ඒ පිළිබඳ නොදන්නා බව පැ.සා විසින් පිළිතුරු ලබා දුන්නේය.

හරස් ප්‍රශ්න විමසීම අවසන් නොවීය. නඩු කටයුතු ඉදිරි දිනට කල් දමන ලදි.

පැ.සා 35 මුදා හැරි අතර පැ.සා 29 හා පැ.සා 2 ට ඉදිරි දිනයේ අධිකරණයේ පෙනී සිටීමට අවවාද කරන ලදි.

**3. Any significant observations inside court room and outside?** (උසාවි කාමරය තුළ හා පිටත සැළකිය යුතු නිරීක්ෂණ තිබේද? ) -

**4. Next date** (ඊළඟ දිනය සහ වේලාව) **:** 2024 සැප්තැම්බර් මස 20 වන දින පෙ.ව 11.00

**5. Media reports about the case on this date** (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා) **:**